# 2012 වර්ෂය සඳහා

# කාර්යසාධන වාර්තාව

# සහ

# වාර්ෂික ගිණුම්

# වාණිජ දෙපාර්තමේන්තුව

# 295 වන ශීර්ෂය

*4වන මහල, රක්ෂණ මන්දිරය,*
*අංක.21, චොක්ෂෝල් වීදිය,,*
*කොළඹ 02*
*දුරකථන: 011- 232 9733 / 243 6114*
*ෆැක්ස්: 011 -243 0233*
*විද්‍යුත් තැපැල:: fortrade@doc.gov.lk*
*වෙබ් අඩවිය :www.doc.gov.lk*

# පටුන


| | | පිටුව |
|---|---|---|
| *1* | හැඳින්වීම | *03* |
| *2* | **2012** වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය | *04* |
| *3* | ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාව | *05* |
| *4* | වෙළඳ, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිෂන් සභා | *09* |
| *5* | බහුපාර්ශ්වික වෙළඳ සම්බන්ධතා | *11* |
| *6* | කලාපීය ආර්ථික සහයෝගීතාව | *13* |
| *7* | වෙළඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනය | *16* |
| *8* | ප්‍රභවස්ථාන සහතික නිකුත්කිරීම (COOs) | *21* |
| *9* | කාර්ය මණ්ඩල සංචලන | *25* |
| *10* | මූල්‍ය ප්‍රකාශය | *26* |


*******************************************

## **1.0** හැඳින්වීම

*දෙපාර්තමේන්තුවේ මෙහෙවර*

> ***"සමස්ත නිෂ්පාදන, ආදායම් සහ වෘත්තීය මට්ටම් දියුණු කිරීම තුළින් ජීවන තත්ත්වය නංවාලීම සහ ඉහළ ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීම මගින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනය සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීමේ අරමුණින් යුතුව, රජයේ වෙළඳ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතා ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටම්වලින් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම."***

**කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශයේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන වාණිජ දෙපාර්තමේන්තුව විසින් ද්විපාර්ශ්වික, කලාපීය සහ බහු පාර්ශ්වික මට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතාවල සමස්ත පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැෙබ්. මෙම තත්වය මත දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යභාරයට වෙළඳ ප්‍රතිපත්ති සහ ප්‍රවර්ධනයට අදාළ කාර්යයන් ඇතුළත් වේ. පහත සාරාංශ කරනු ලැබ ඇති දැ දෙපාර්තමේන්තුව විසින් එලෙස ඉටුකරනු ලබන පුළුල් කාර්ය ක්ෂේත්‍රයන් වේ.**

- **අදාළ රේඛීය අමාත්‍යාංශ / අධිකාරීන් සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන්ගේ සමීප සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.**
- **රටෙහි අපේක්ෂිත සමස්ත සංවර්ධනය පිළිබඳ විශේෂ අවධානයක් සහිතව විදේශ වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය වෙත උපදෙස් ලබාදීම.**
- **විදේශ වෙළඳ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය යන ක්ෂේත්‍රයන් පිළිබඳ ශ්‍රී ලංකාවේ වාණිජමය අපේක්ෂාවන් ප්‍රවර්ධනය කිරීම.**

**සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, දෙපාර්තමේන්තුව විසින් විදේශ වෙළඳාම පිළිබඳ රජයේ දැක්ම සහ රටෙහි සමස්ත ආර්ථික සංවර්ධනය කෙරෙහි දැක්විය හැකි මුඛ්‍ය දායකත්වය මත පදනම් ව එහි කාර්ය වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබීය. මෙලෙස, 2012 වසරේ කාර්ය වැඩසටහන මගින්, අනෙකුත් කාර්යයන් අතර, පවත්නා වෙළඳ සීමා තවදුරටත් ශක්තිමත් කිරීම, නව වෙළඳපළ සහ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, ජාත්‍යන්තර වෙළඳාම් ක්‍රමයට ඵලදායී ලෙස සහභාගීවීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) අංශය දිරිගැන්වීම සහ දකුණු ආසියානු කලාපයේ වෙළඳ මූලස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම කෙරෙහි ද අවධානය යොමුකරන ලදී. දෙපාර්තමේන්තුව විසින් එහි විදේශ වෙළඳ නියෝජනය මගින්,**

සෘජු විදේශ ආයෝජන සහ ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම සහ සහාය ද ලබාදෙන ලදී.

## 2.0 2012 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය

### 2.1 අපනයන සහ ආනයන කාර්ය සාධනය

**2011** වසරේදී ඇමෙරිකානු ඩොලර් මිලියන **10,559**ක් වූ ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ඉපැයුම්, **2012** වර්ෂය තුළදී **7.4%**ක අඩුවීමක් සනිටුහන් කරමින් ඇමෙරිකානු ඩොලර් මිලියන **9,774** ක් දක්වා පහත වැටුණි. කාර්මික සහ කෘෂිකාර්මික යන අංශ දෙකෙහි අපනයන ඉපැයුම් **7.8**%ක අඩුවීමක් වාර්තා කරන ලදී. ඇමෙරිකානු ඩොලර් මිලියන **1,412**ක් වූ තේ **5.3%**ක අඩුවීමක් සනිටුහන් කරමින් කෘෂිකාර්මික අපනයන තොගයට ඇතුළත් වූ අතර, **2011** වර්ෂය හා සැසඳීමේදී රබර් අපනයන ඉපැයුම් **39.4%**ක අඩුවීමක් වාර්තා කරන ලදී.

**2011** වර්ෂයට සාපේක්ෂව, **2012** වසරේදී ඇමෙරිකානු ඩොලර් මිලියන **7,371**ක් වූ කාර්මික නිෂ්පාදන අපනයන **7.8%**ක අඩුවීමක් පෙන්නුම් කරන ලදී. රෙදි පිළි සහ ඇඟළුම් අංශය මගින් සමස්ත අපනයන ඉපැයුම් සඳහා විශාලතම දායකත්වය ලබාදෙන ලද අතර එම ප්‍රමාණය **41%**ක් විය. **2011** වසරේදී ඇමෙරිකානු ඩොලර් මිලියන **4,191** ක් වූ ඇඟළුම් අපනයන **2012** වසරේදී **5%**ක පහත වැටීමක් වාර්තා කරමින් ඇමෙරිකානු ඩොලර් මිලියන **3,991** ක් දක්වා අඩුවිය. රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, කාර්මික අපනයන සඳහා පිළිවෙළින් දෙවන සහ තෙවන විශාලතම දායකත්වයන් වේ.

***1-*** *වගුව*

**මුළු ආනයන, අපනයන සහ වෙළඳ ශේෂය : 2008 - 2012**
**(වටිනාකම: ඇමෙරිකානු ඩොලර් මිලියන)**

| වර්ෂය | අපනයන | වර්ධන ප්‍රතිශතය | ආනයන | වර්ධන ප්‍රතිශතය | මුළු වෙළඳාම | වෙළඳ ශේෂය |
|---|---|---|---|---|---|---|
| 2008 | 8,179 | 6.3 | 14,191 | 24.5 | 22,145 | - 5,871 |
| 2009 | 7,085 | - 13.0 | 10,206 | - 28.0 | 17,291 | -3,121 |
| 2010 | 8,626 | 21.7 | 13,451 | 31.8 | 22,076 | -4,826 |
| 2011 | 10,559 | 22.4 | 20,269 | 50.9 | 29,721 | -9,685 |
| 2012 | 9,774 | -7.4 | 19,183 | -5.4 | 28,957 | -9,409 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

## 3.0 ද්විපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සහයෝගීතාව

පෙර වර්ෂය සැළකිල්ලට ගත්කළ, ශ්‍රී ලංකාව විසින් ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය, රුසියාව, චීනය, ඉන්දියාව, පාකිස්ථානය සහ ඉරානය වැනි ප්‍රධානතම වෙළෙඳ හවුල්කරුවන් සමඟ ද්විපාර්ශ්වික වෙළෙඳ හා ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් දැඩි විමසිල්ලකින් හා අවධාරණයකින් යුතුව කටයුතු කරන ලදී. එමෙන්ම, ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව හා පාකිස්ථානය අතර අත්සන් තබන ලද ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) යටතේ වාණිජමය ප්‍රතිලාභ වැඩිදියුණු කරගැනීම පිළිබඳවද සමාන වැදගත්කමක් දක්වන ලදී.

### 3.1 ඉන්දු -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)

1998 දෙසැම්බර් 28වන දින අත්සන් තබන ලද, 2000 මාර්තු මස 01වන දින සිට ක්‍රියාත්මක ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම මගින් දෙරට අතර වෙළඳාම් වන පුළුල් නිෂ්පාදන පරාසයක් සඳහා තීරුබදුවලින් නිදහස්වීමේ සහන සැලසේ. ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම 2008 නොවැම්බර් මාසයේ සිට පූර්ණ වශයෙන් ක්‍රියාත්මකවී ඇති අතර නිෂ්පාදන වර්ග 4000කට අධික ප්‍රමාණයක් තීරුබදුවලින් නිදහස් පදනම මත ඉන්දියානු වෙළඳපොළ වෙත අපනයනය කිරීමේ හැකියාව ශ්‍රී ලංකාව වෙත ලැබී ඇත.

2012 වසරේදී ඇ.ඩො. මිලියන 566 ක්වූ ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත කරන ලද අපනයන ප්‍රමාණය, 2011 වසරේදී වාර්තා වූ ඇ.ඩො. මිලියන 522 හා සසඳන විට, 8.6%ක වර්ධනයක් සනිටුහන් කර ඇත. මෙම ඉහළ යාමට මූලික වශයෙන්ම හේතු වූයේ, ගැල් සඳහා නිර්මිත සහ සම්පාදිත බහාලුම්, සත්ත්ව ආහාර, ස්වභාවික රබර්, අතුරුමාරු කළ හැකි යන්ත්‍රෝපකරණ, සුළං පුරවන ලද අලුත් රබර් ටයර්, රෙදිපිළි උපාංග, කුරුඳු, තාප කඩදාසි, ලෙඩ් ඔක්සයිඩ්, මංගලෝත්සව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ආදී අපනයනයන්හි සිදු වූ කැපී පෙනෙන ඉහළයාම විය. ඉහත සඳහන් කරන ලද නිෂ්පාදන ඇතුළත් අපනයන නිෂ්පාදන බොහොමයක් ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඉන්දියාව වෙත අපනයනය කරනු ලැබ ඇති බව සඳහන් කිරීම මෙහිලා වැදගත් වේ. 2012 වසරේදී ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබ ඇති මූළ ප්‍රභවස්ථාන සහතික සංඛ්‍යාව 9,742කි. මෙය, 2011 වසරේදී නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික 10,277 හා සසඳන විට, 5%ක අඩුවීමක් පෙන්නුම් කෙරේ. අනෙක් අතට, 2012 වසරේදී ඇ.ඩො. මිලියන 3,517 ක්වූ ඉන්දියාවෙන් ශ්‍රී ලංකාව වෙත කරන ලද ආනයන ප්‍රමාණය, 2011 වසරේදී වාර්තා වූ ඇ.ඩො. මිලියන 4,350 හා සසඳන විට, 19%ක පහත වැටීමක් පෙන්නුම් කෙරේ.

### 3.2 ඉන්දියාව සමඟ විස්තීර්ණ ආර්ථික හවුල් ගිවිසුම (CEPA)

වත්මන් ද්විපාර්ශ්වික ආර්ථික සබඳතා තවදුරටත් ශක්තිමත්කර ගනු පිණිස ඉන්දියාව සමඟ විස්තීර්ණ ආර්ථික හවුල් ගිවිසුම (CEPA) පිළිබඳ සාකච්ඡා සම්මුති පැවැත්වීමේ ක්‍රියාවලියෙහි ශ්‍රී ලංකාව නිරතව සිටියි. 2008 වසරේ ජූලි මස පැවති වෙළඳාම පිළිබඳ සාකච්ඡා සම්මුති කමිටුවේ තෙවන වටය අවසන්වීමෙන් පසු යෝජිත ගිවිසුම පිළිබඳ විධිමත් සාකච්ඡා කිසිවක් මෙතෙක් පවත්වා නැත. 2008 වන විට, රජයන් දෙක විසින්, සාකච්ඡා සම්මුති වට 13ක් පැවැත්වීමෙන් අනතුරුව යෝජිත විස්තීර්ණ ආර්ථික හවුල් ගිවිසුම (CEPA) සඳහා වන ගිවිසුම් කෙටුම්පතෙහි කටයුතු බොහොමයක් අවසන් කර තිබුණි. කෙසේවෙතත්, විස්තීර්ණ ආර්ථික හවුල් ගිවිසුම (CEPA) සම්බන්ධයෙන්, විශේෂයෙන් සේවා ලිහිල්කරණය සම්බන්ධයෙන් මතුවිය හැකි අහිතකර බලපෑම් පිළිබඳව ශ්‍රී ලංකාවේ සිටින පෞද්ගලික අංශයේ ඇතැම් පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු හේතුවෙන් විස්තීර්ණ ආර්ථික හවුල් ගිවිසුම සඳහා වූ සාකච්ඡා සම්මුති 2008 වසරේ දී නතර කරන ලදී.

ඉන්දියාව සමඟ වන යෝජිත ගිවිසුම සම්බන්ධ කරුණු කාරණා සොයා බැලීම සඳහාත්, ගිවිසුම් කෙටුම්පත සකස්කිරීම සඳහාත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව අන්තර්-ආයතන-කමිටුවක් (IAC) 2011 පෙබරවාරි අවසානයේදී ස්ථාපිත කරන ලදී. සාකච්ඡා වට කිහිපයකින් අනතුරුව, අන්තර්-ආයතන-කමිටුව විසින් ආයෝජන පිළිබඳ පරිච්ඡේදය හැර විස්තීර්ණ ආර්ථික හවුල් ගිවිසුමේ අනෙකුත් සියලුම පරිච්ඡේද සංශෝධනය කිරීමේ කටයුතු අවසන් කරන ලදී.

ඉන්දියාව විසින් ඉදිරිපත් කරන ලද ආයෝජන පරිච්ඡේදයේ නව කෙටුම්පත පිළිබඳව මූලික සාකච්ඡා කිහිපයක් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදාළ නිලධාරීන් සහ එහි ඉන්දියානු අනුගාමිකයා වන කාර්මික ප්‍රතිපත්ති හා ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් 2012 ජූලි 16 සහ 17 යන දිනයන්හි කොළඹදී හමුවන ලදී. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් එහි අදහස වාණිජ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. එහෙත් එතැන් සිට, විස්තීර්ණ ආර්ථික හවුල් ගිවිසුම පිළිබඳ සාකච්ඡා ඉදිරියට පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලබාදී නොමැති බැවින් විස්තීර්ණ ආර්ථික හවුල් ගිවිසුම පිළිබඳ සාකච්ඡාවල ප්‍රගතියක් නොමැත. ඒ අනුව විස්තීර්ණ ආර්ථික හවුල් ගිවිසුම පිළිබඳ සාකච්ඡාවල ප්‍රගතියක් නොමැති වුවද, ඒකාබද්ධ කොමිෂන් සභාව සහ මෑතකදී නිමාවට පත්වූ වාණිජ ලේකම් මට්ටමේ රැස්වීම තුළින් ශ්‍රී ලංකාව සහ ඉන්දියාව විසින් වෙළඳ, තාක්ෂණික සහයෝගීතාව, සංචාරක, සංවර්ධන සහයෝගීතාව සහ ආයෝජන පෙර නොවූ විරූ ඉහළ තලයකට රැගෙන ඒම පිණිස පහත සඳහන් මූලාරම්භයන් සඳහා එකඟතාව පළ කරනු ලැබ ඇත.

1. වෙළඳ හිඟය අඩුකිරීම කෙරෙහි අවධානය යොමුකරමින් වසර 3කට අධික කාලයක් ඇ.ඩො. බිලියන 10ක් දක්වා ද්විපාර්ශ්වික වෙළඳාම පුළුල් කිරීම.
2. වර්තමාන තත්ත්වය සහ අනාගත අභිවෘද්ධිය වඩාත් හොඳින් පිළිබිඹු කිරීම සඳහා සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳව පවත්නා අවබෝධතා ගිවිසුම ප්‍රතිශෝධනය කිරීම.
3. රේගු සහයෝගීතාව පිළිබඳ ද්විපාර්ශ්වික ගිවිසුම.

4. ද්වි මාර්ගික ආයෝජන වැඩිකිරීම සඳහා ද්විත්ව බදුකරණය මගහරවාගැනීම පිළිබඳ ගිවිසුම.
5. රෙදිපිළි, අත්යන්ත්‍ර (Handloom) සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SMEs) ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධතා ගිවිසුම.
6. තීරුබදු නොවන සම්බාධක (NTBs) ඉවත්කිරීම සහ වෙළඳාම පුළුල් කිරීම සඳහා ප්‍රමිතීන් පිළිබඳ අන්‍යෝන්‍ය අවබෝධතා ගිවිසුම (Mutual Recognition Agreement).

### 3.3 පාකිස්ථාන – ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)

පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම 2005 ජුනි මස 12 වන දින බලාත්මක වීමෙන් පසුව ශ්‍රී ලංකාව සහ පාකිස්ථානය අතර වෙළඳාමෙහි සැළකියයුතු වර්ධනයක් වාර්තාවී ඇත. 2004 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 147ක් වූ දෙරට අතර මුළු වෙළඳ වටිනාකම 2011 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 410.5ක් දක්වා වැඩිවී ඇත. 2004 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 39ක් වූ පාකිස්ථානය වෙත ශ්‍රී ලංකාවේ අපනයන 2008 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 71ක් දක්වා වැඩිවී ඇත. එහෙත්, ප්‍රධාන වශයෙන් දිසිදි පොල් අපනයනයෙහි පහත වැටීම සහ ගෝලීය මන්දගාමීත්වය හේතුකොටගෙන 2009 වර්ෂයේදී පාකිස්ථානය වෙත ශ්‍රී ලංකාවේ අපනයන ඇමෙරිකානු ඩොලර් මිලියන 55ක් දක්වා 23%කින් පහත වැටී ඇත. පාකිස්ථානය සඳහා ශ්‍රී ලංකාවේ අපනයන නැවතත් එහි ගාමක බලය ලබාගනිමින් 2012 වර්ෂයේදී 10%ක වර්ධනයක් පෙන්වමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 82.75ක් දක්වා වැඩිවී ඇත. පාකිස්ථානය, සාර්ක් කලාපය තුළ ඉන්දියාවට පසුව ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වෙළඳ හවුල්කරු වේ.

ස්වාභාවික රබර්, කොප්පරා, තේ, පොල්, කුළුබඩු සහ බුලත් කොළ යනාදිය පාකිස්ථානය වෙත ශ්‍රී ලංකාව විසින් සිදු කරනු ලබන ප්‍රධාන අපනයනයන්ට ඇතුළත් වේ. පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක වීමෙන් අනතුරුව, නව නිෂ්පාදන පෙළක්ද පාකිස්ථාන වෙළඳපළ වෙත අවතීර්ණ වී ඇති අතර, ඇඟළුම්, එම්ඩීඑෆ් පුවරු, විස්කෝතු, නැවුම් අන්නාසි, ක්‍රීඩා භාණ්ඩ, ඇට සහිත සියඹලා, බාද්‍ය තෙල්, පෝසිලේන් පිඟන් භාණ්ඩ සහ මුළුතැන්ගෙයි උපකරණ, පිඟන් ගඩොල්, ගෘහභාණ්ඩ, තීන්ත, වීදුරු පින්තාරු, සම් භාණ්ඩ, සීතකළ මාළු, ඉස්සෝ, පොකිරිස්සෝ, කකුළුවෝ, කැපූ මල් සහ විසිතුරු පත්‍ර, මැණික් හා ස්වර්ණාභරණ සහ සුරතල් මසුන් යනාදී අයිතමයන් මෙම නව නිෂ්පාදනයන්ට ඇතුළත් වේ.

### 3.4 ශ්‍රී ලංකාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය අතර වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ මූලික ගිවිසුම (TIFA)

2002 වසරේදී අත්සන් කරන ලද වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ මූලික ගිවිසුම මගින් රටවල් දෙක අතර සමීප වෙළඳ සහ ආර්ථික සහයෝගීතාවක් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රයෝජනවත් ආයතනික වැඩපිළිවෙළක් සපයා දෙනු ලැබේ. දෙරට අතර වෙළඳාමට බාධා ගෙන දෙන කිසියම් බාධකයක් අදාළ බලධාරීන්ට හඳුනා ගත හැකිවන පරිදි සහ ඒ සඳහා විසඳුම් ලබාදිය හැකිවන පරිදි ඉහළ මට්ටමේ වෙළඳ නිලධාරීන් අතර ක්‍රමානුකූල සබඳතාවකට එමගින් පහසුකම් සලසා දෙනු ලැබේ.

වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ මූලික ගිවිසුමේ සන්දර්භයෙහි ශ්‍රී ලංකාව මූලික වශයෙන් ඉලක්ක කරනුයේ, (අ) නිෂ්පාදන ආවරණය සහ ප්‍රභවස්ථාන නීති යනාදිය සම්බන්ධයෙන් අතිරේක නම්‍යතාවන් සහිතව කිසියම් විශේෂිත වෙළඳ වරණයන් හෝ එක්සත් ජනපද වරණීය පොදු ක්‍රම (US GSP) පහසුකම හෝ තුළින් විශේෂ ඇහලුම් අපනයනයන් සඳහා දියුණු වෙළඳපළ ප්‍රවේශය සුරක්ෂිත කිරීම සහ (ආ) බුද්ධිමය දේපළ හිමිකම්, වෙළඳාම පහසුකරණය, වෙළඳ හැකියා ප්‍රවර්ධනය හා ශ්‍රී ලාංකික කුරුඳු සඳහා සන්නම් නාම යෙදීම, අපනයන යොමුගත පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා බලශක්ති කළමනාකරණය, එක්සත් ජනපද ආහාර සහ ඖෂධ පරිපාලනය (FDA) පිළිබඳ දැනුම ඇතිකිරීම, ලේබල්කරණ අවශ්‍යතාවන් සහ වාණිජ ආරවුල් බේරුම්කිරීමේ ප්‍රදේශවල නීතිඥවරුන්ගේ සහ පරිපාලකයින්ගේ ශක්‍යතා වර්ධනය, රජයේ ප්‍රසම්පාදන, රේගු සහයෝගීතාව සහ වාණිජමය ගැටළු සහ ශ්‍රී ලංකාවේ ආයෝජන වාතාවරණය වැනි වපසරියන් තුළ එක්සත් ජනපද සහයෝගීතාව අනුගමනය කිරීම යන අංශ කෙරෙහිය.

එක්ස්පෝ ශ්‍රී ලංකා 2012 පැවැත්වෙන අතරතුරදී, එක්සත් වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ මූලික ගිවිසුම යටතේ ඒකාබද්ධ කවුන්සිලයේ 10වන රැස්වීම 2012 පෙබරවාරි 27වන දින ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී. කර්මාන්ත හා වාණිජ ලේකම්වරයා විසින් ශ්‍රී ලංකා දූත පිරිස මෙහෙයවූ අතර, මධ්‍යම හා දකුණු ආසියාව සඳහා වන සහකාර එක්සත් ජනපද වෙළඳ නියෝජිතවරයා විසින් එක්සත් ජනපද දූත පිරිස මෙහෙයවන ලදී.

නිල දූත පිරිසට අමතරව, එක්ස්පෝ ශ්‍රී ලංකා 2012 වෙත සහභාගිවීම සඳහා වොෂින්ටනයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රධාන ව්‍යාපාරිකයින්ගෙන් සමන්විත පෞද්ගලික අංශයේ දූත පිරිසක් ද සංවිධානය කරන ලදී.

ඉහත සඳහන් කරුණු වලට අමතරව, කාන්තාවන් සවිබලගැන්වීම සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය කෙරෙහි කාන්තා දායකත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය වෙත සහාය දැක්වීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපද පාර්ශවය ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ කර ඇත. දකුණු හා මධ්‍යම ආසියාතික කටයුතු සඳහා වන නියෝජ්‍ය සහකාර එක්සත් ජනපද වෙළඳ නියෝජිතවරයා කාන්තා වාණිජ මණ්ඩලය හමුවූ අතර, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය කෙරෙහි ශ්‍රී ලංකා කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීමෙහිලා එක්සත් ජනපද පාර්ශවයට දායකත්යව ලබාදිය හැක්කේ කෙසේද යන්න පිළිබඳව සාකච්ඡා කිරීම සඳහාත් තවදුරටත් තොරතුරු රැස්කිරීම සඳහාත් සාමාජිකයින් සමඟ හමුවක් පවත්වන ලදී. කාන්තා වාණිජ මණ්ඩලය විසින් ශ්‍රී ලාංකික කාන්තා ව්‍යවසායකයින් සඳහා ලබාදෙන්නාවූ දායකත්යව හඳුනාගනිමින්, එක්සත් ජනපද පාර්ශවය විසින්, ඔවුන්ගේ සහයෝගීතාව ලබාදීම සඳහා ඔවුන් සමඟ සාකච්ඡාමය සම්බන්ධතාවක් පවත්වාගෙන යන ලෙස වාණිජ මණ්ඩලයෙන් ඉල්ලීමක් කරන ලදී.

ඇමෙරිකා එක්සත් ජනපද දූත පිරිස විසින්, ශ්‍රී ලාංකික ව්‍යවසායකයින්ගේ, විශේෂයෙන් එක්සත් ජනපද වෙළඳපළ වෙත අපනයනය කරන්නන්ගේ යහපත උදෙසා එක්සත් ජනපද GSP වැඩසටහන පිළිබඳව දැනුවත්භාවය ඇතිකිරීමේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. වර්තමානයේදී, ශ්‍රී ලංකාව විසින් GSP ප්‍රතිලාභ

යටතේ එක්සත් ජනපදය වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන **150**ක් පමණ වටිනා භාණ්ඩ අපනයනය කරනු ලබන අතර, ශුන්‍ය තීරුබද්ද පදනම මත එක්සත් ජනපද වෙළඳපළ වෙත අවතීර්ණ වේ.

### 3.4.1 ශ්‍රී ලංකාවේ කම්කරු අයිතීන් පිළිබඳ US-GSP Country Practice Petition නිමාවට පත්කිරීම

ශ්‍රී ලංකාව තුළ සිදු කළා යැයි කියන එක්තරා කම්කරු අයිතීන් කඩකිරීමක් හේතුකොටගෙන ශ්‍රී ලාංකික අපනයන සඳහා වරණීය පොදු යෝජනා ක්‍රමයේ (GSP) ප්‍රතිලාභ අත්හිටුවන ලෙස එක්සත් ජනපද රජයෙන් ඉල්ලා සිටිමින් ඇමෙරිකා එක්සත් ජනපදයේ (USA) විශාලතම කම්කරු සමිති සම්මේලනය වන ඇමෙරිකානු කම්කරු සම්මේලනය සහ කාර්මික සංවිධාන සංසදය (AFL CIO), **2009** දෙසැම්බර් මාසයේදී එක්සත් ජනපදයේ වෙළෙඳ නියෝජිත (USTR) කාර්යාලයේ Country Practice පෙත්සමක් ගොනුකර තිබුණි. එක්සත් ජනපදයේ වෙළෙඳ නියෝජිත කාර්යාලයේ එක්සත් ජනපද වරණීය පොදු යෝජනා ක්‍රම වැඩසටහන (US GSP Programme) භාර නිලධාරියා විසින් මුලසුන දරනු ලබන එක්සත් ජනපද වරණීය පොදු යෝජනා ක්‍රමයේ අනු කාරක සභාව, එක්සත් ජනපදයේ කම්කරු, වාණිජ, රාජ්‍ය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තු, එක්සත් ජනපද භාණ්ඩාගාරය සහ එක්සත් ජනපද ආධාර (US AID) යනාදී ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත වූ අතර, ඇමෙරිකානු කම්කරු සම්මේලනය සහ කාර්මික සංවිධාන සංසදය (AFL CIO) විසින් සිදු කරන ලද දෝෂාරෝපණය පිළිබඳව නිගමනයකට එළඹීමට පෙරාතුව ඉහත පෙත්සම පිළිබඳව සමාලෝචනයක් සිදු කිරීමට තීරණය කර තිබුණි.

මහජන අදහස් විමසීම , අදාළ පාර්ශ්වයයන්ගෙන් පශ්චාත් කරුණු විභාග කිරීමේ අදහස් ලබාගැනීම සහ එක්සත් ජනපද අනු කාරක සභාවේ නිලධාරීන් විසින් සත්‍යාපන සංචාරයන් සිදු කිරීම යනාදිය මෙම සමාලෝචන ක්‍රියාවලියට ඇතුළත් වූහ.

සමාලෝචන ක්‍රියාවලිය අතරතුරදී, **2012** ජනවාරි **24**වන දින වොෂින්ටන් ඩීසීහි දී පවත්වන ලද AFL CIO පෙත්සම සමාලෝචනය පිළිබඳ දෙවන මහජන අදහස් විමසීමට පෙරාතුව, **2012** ජනවාරි **10**වන දින ශ්‍රී ලංකාව විසින් විස්තීර්ණ පූර්ව විභාග කිරීමේ කරුණු සැළකිරීමක් සිදු කරන ලදී. ශ්‍රී ලංකා රජය මගින් එය පිළිබඳ පශ්චාත් කරුණු විභාග කිරීමේ අදහස් **2012** පෙබරවාරි **23**වන දින එක්සත් ජනපදයේ වෙළෙඳ නියෝජිත (USTR) කාර්යාලය වෙත ලබාදෙන ලදී.

US GSP පෙත්සමෙහි දක්වා ඇති කම්කරු අයිතීන් පිළිබඳ ගැටළු වලට විසඳුම් සෙවීම සඳහා පසුගිය වසර කිහිපය පුරා ශ්‍රී ලංකා රජය මගින් දරන ලද සැළකිය යුතු අඛණ්ඩ ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස, එක්සත් ජනපද වරණීය පොදු යෝජනා ක්‍රමයේ (US GSP) ප්‍රතිලාභ අඛණ්ඩව භුක්තිවිඳීමට ශ්‍රී ලංකාවට හැකියාව ලබාදෙමින් ශ්‍රී ලංකාවේ US GSP කම්කරු අයිතීන් සමාලෝචනය නිල වශයෙන් නිමාවට පත්කළ බව එක්සත් ජනපදයේ වෙළෙඳ නියෝජිත (USTR) කාර්යාලය මගින් **2012** ජනවාරි **29**වන දින ප්‍රකාශයට පත් කරන ලදී.

## 4.0 වෙළඳ, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිෂන් සභා

වාණිජ දෙපාර්තමේන්තුව විසින්, අමාත්‍යාංශ මට්ටමින් පවත්වනු ලබන පහත සඳහන් ද්විපාර්ශ්වික ඒකාබද්ධ කොමිෂන් / කමිටු යටතේ වන වෙළෙඳාම සම්බන්ධ ගැටලු සම්බන්ධීකරණය කිරීම සඳහා වගකියනු ලැබේ.

- ශ්‍රී ලංකාව - බංග්ලාදේශය
- ශ්‍රී ලංකාව - ඊජිප්තුව
- ශ්‍රී ලංකාව - ඉරානය
- ශ්‍රී ලංකාව - මාලදිවයින
- ශ්‍රී ලංකාව - ඉරාකය
- ශ්‍රී ලංකාව - චීනය
- ශ්‍රී ලංකාව - ඉන්දියාව
- ශ්‍රී ලංකාව - කුවේටය
- ශ්‍රී ලංකාව - පාකිස්ථානය
- ශ්‍රී ලංකාව - තායිලන්තය

### 4.1 බංග්ලාදේශය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසමේ 4වැනි සැසිවාරය

බංග්ලාදේශය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසමේ 4වැනි සැසිවාරය, 1993 වසරේදී ශ්‍රී ලංකාවේදී 3වැනි සැසිවාරය පැවැත්වීමෙන් අනතුරුව දශක දෙකකට ආසන්න කාලයේදී 2012 මාර්තු 7 සිට 8 දක්වා බංග්ලාදේශයේ ඩකා හිදී පවත්වන ලදී.

කර්මාන්ත හා වාණිජ අමාත්‍ය, ගරු. රිෂාඩ් බදියුඩීන් මැතිතුමා විසින් ශ්‍රී ලංකා දූත පිරිස මෙහෙයවූ අතරතුර, බංග්ලාදේශයේ මුදල් අමාත්‍ය, ගරු. අබ්දුල් මැල් අබ්දුල් මුහිත් මහතා විසින් බංග්ලාදේශ දූත පිරිස මෙහෙයවන ලදී. ද්විපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සබඳතා සඳහා වන අවස්ථාවන් පිළිබඳව මෙන්ම සම්බාධක පිළිබඳවත් මෙම සභාවාරයේදී සාකච්ඡාවට භාජනය කරන ලද අතර, එකිනෙකාගෙන් එකිනෙකා වෙත ද්විපාර්ශ්වික වෙළඳ පරිමාව සහ ආයෝජන ඉහළනැංවීම සඳහා මෙම ක්ෂේත්‍රයන් පිළිබඳ උපදේශනයන් තවදුරටත් තීව්‍ර කිරීම සඳහා එකඟවන ලදී. දෙපාර්ශවය විසින්, දෙරට පවත්නා විභවතාවන් සොයාබැලීම සඳහා සාර්ක් කලාපය තුළ වෙළඳාම කඩිනම් කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ කැපවීම ප්‍රකාශ කරන ලදී.

**4.2** ශ්‍රී ලංකාව සහ යුක්‍රේනය අතර වෙළඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ අන්තර් රාජ්‍ය ඒකාබද්ධ කොමිසමක් පිහිටුවීම

වෙළඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ අන්තර් රාජ්‍ය ඒකාබද්ධ කොමිසමක් පිහිටුවීම පිළිබඳ ශ්‍රී ලංකාවේ සහ යුක්‍රේනයේ රජයන් අතර ගිවිසුම් කෙටුම්පත සම්බන්ධයෙන් සවිස්තරාත්මක සාකච්ඡාවන් සඳහා ශ්‍රී ලංකාවේ සහ යුක්‍රේනයේ දූත පිරිස් 2012 මැයි 22 කොළඹදී හමුවූහ. වාණිජ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විසින් ශ්‍රී ලංකා දූත පිරිසේ මූලිකත්වය දරන ලද අතර, යුක්‍රේනයේ ආර්ථික සංවර්ධන හා වෙළඳ අමාත්‍යාංශයේ විදේශ ආර්ථික ප්‍රතිපත්ති සඳහා වන නීති ආධාර අංශයේ ප්‍රධානියා විසින් යුක්‍රේනයේ දූත පිරිසේ මූලිකත්වය දරන ලදී.

සාකච්ඡා සම්මුති අවසානයේදී එකඟත්වයකට එළඹෙන ලද ඒකාබද්ධ ගිවිසුම් කෙටුම්පතෙහි පදනම මත විවෘත, සුහදශීලී සහ හිතකර වාතාවරණයක් යටතේ මෙම සාකච්ඡා පවත්වන ලදී.

## 5.0 බහු-පාර්ශ්වික වෙළඳ සම්බන්ධතා

ශ්‍රී ලංකාවේ බහු පාර්ශ්වික වෙළෙඳ සම්බන්ධතා මගින් ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) ගිවිසුම් කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබයි. ශ්‍රී ලංකාව විසින්, වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD), ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ ලෝක වෙළඳ සංවිධාන නීතිය පිළිබඳ උපදේශක මධ්‍යස්ථානය (ACWL) ඇතුළත් වෙනත් බහු පාර්ශ්වීය සංවිධාන කිහිපයක් සමඟ සමීප සහසම්බන්ධතාවක් ද පවත්වාගෙන යනු ලැබේ.

### 5.1 ලෝක වෙළඳ සංවිධානය (WTO)

සමස්තයක් ලෙස, ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ සාකච්ඡා සම්මුතිවල දෝහා සංවර්ධන වටයෙහි සාකච්ඡා සම්මුති 2012 වර්ෂයේදී මන්දගාමී ලෙස පැවතුන අතර එම සාකච්ඡා සම්මුතිවල සැබෑ ප්‍රගතියක් නොපැවතුණි. එහෙත්, 2013 දෙසැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිත 9වන ලෝක වෙළඳ සංවිධානයේ අමාත්‍යමය සම්මේලනය මගින් තීරණාත්මක ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳ නියමයන් තීරණය කිරීමේ අදහසින් යුතුව මෙම සාකච්ඡා වටය නිමාවට පත්කිරීමේ අවශ්‍යතාව සාමාජිකයින් විසින් අවධාරණය කරන ලද අතර 2013 වර්ෂයේදී නැවත එහි නිරතවීමට එකඟවන ලදී.

එහි ප්‍රතිඵලයක් ලෙස, කෘෂිකර්මාන්තය, කෘෂිකාර්මික නොවන ද්‍රව්‍ය සඳහා වෙළඳපළ ප්‍රවේශය (NAMA), බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පිළිබඳ වෙළඳාම හා සම්බන්ධ අංශය (TRIPS), සේවා සහ නීති රීති පිළිබඳව

විසඳීමට ඇති ගැටළු විසඳීම සඳහා විවිධ සාකච්ඡා කණ්ඩායම් විසින් දැඩි ලෙස ප්‍රයත්න දරන ලද අතර වෙළඳ පහසුකරණය පිළිබඳ ගිවිසුම් කෙටුම්පතෙහි කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

රුසියානු සමූහාණ්ඩුව, 2012 අගෝස්තු මාසයේදී ලෝක වෙළඳ සංවිධානයට විධිමත් ලෙස සම්බන්ධ විය. සැමෝවා, මොන්ටිනීග්‍රෝ සහ වනවාටු අනෙකුත් නව සාමාජිකයන්ට ඇතුළත් වූහ. 2013 වර්ෂයේදී අවසාන වශයෙන් එකතුවීමේ අදහසින් යුතුව ලාඕසය සහ ටජිකිස්ථාන් ඔවුන්ගේ සාකච්ඡා සම්මුති නිමාවට පත්කරන ලදී.

ශ්‍රී ලංකාව, ලෝක වෙළඳ සංවිධානයේ දෝහා සංවර්ධන වටයෙහි සාකච්ඡා සම්මුතිවලට සහභාගීවීම අඛණ්ඩව සිදු කරන ලදී. සුළු හා අවදානම් සහිත ආර්ථිකයක් (SVE) වශයෙන් ශ්‍රී ලංකාව විසින් කෘෂිකර්මාන්තය, කෘෂිකාර්මික නොවන ද්‍රව්‍ය සඳහා වෙළඳපළ ප්‍රවේශය (NAMA), බුද්ධිමය දේපළ සහ වෙළඳ පහසුකරණය ඇතුළත් ප්‍රමුඛ ක්ෂේත්‍ර කිහිපයක් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබ ඇත.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේදී, ශ්‍රී ලංකාවේ අවධානය යොමු වනුයේ සුළු හා අවදානම් සහිත ආර්ථිකයන් (SVEs) සහ ශුද්ධ ආහාර ආනයනය කිරීමේ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් (NFIDC) සඳහා වන නම්‍යතාවන් කෙරෙහිය. මෙම නම්‍යතාවන්ට ඇතුළත් වනුයේ, වෙළඳපළ ප්‍රවේශයේදී අවම බැඳීම් භාරගැනීම, ආනයන ඉහළයාම් වලට එරෙහිව ගෘහස්ත කෘෂිකර්මාන්තය ආරක්ෂා කරගැනීම සඳහා වන යාන්ත්‍රණයන් සහ දේශීය වශයෙන් ආධාර ලබාදීමේදී බැඳීම් අවකරණයෙන් නිදහස් කිරීමයි.

කෘෂිකාර්මික නොවන වෙළඳපළ ප්‍රවේශයේ (NAMA) දී, ශ්‍රී ලංකාවේ අවධානය යොමු වනුයේ ප්‍රධාන වෙළඳපළ තුළ එහි ප්‍රධාන අපනයන, විශේෂයෙන් ඇඟළුම් සහ මත්ස්‍ය වර්ග සඳහා පවත්නා ඉහළ තීරු බදු අඩු කිරීම තුළින් දියුණු වෙළඳපළ ප්‍රවේශයක් ළඟාකරගැනීම කෙරෙහිය. මීට අමතරව, ශ්‍රී ලංකාව තීරුබදු අඩු කිරීමේ බැඳීම්වලින් නිදහස්ව පවතී.

බුද්ධිමය දේපළ අයිතිවාසිකම් (IPR) පිළිබඳ ක්ෂේත්‍රයේදී, ශ්‍රී ලංකාව භූගෝලීය දර්ශක සහ සාම්ප්‍රදායික දැනුම ආරක්ෂණය ශක්තිමත් කිරීම සඳහා සාකච්ඡා සම්මුතිවල නිරතවන ලදී.

තවද, ශ්‍රී ලංකාව වෙළඳාම් පහසුකරණ ක්‍රියාපටිපාටි සහ රෙගුලාසි ඒකාබද්ධකරණය ඉලක්ක කරගත් වෙළඳාම් පහසුකරණය පිළිබඳ නව ගිවිසුමක් සම්බන්ධයෙන් ද අඛණ්ඩව සාකච්ඡා කරන ලදී.

අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳ සාකච්ඡා සම්මුතිවලදී, ශ්‍රී ලංකාව විසින්, සුළු හා අවදානම් සහිත ආර්ථිකයක් (SVE) වශයෙන් ශ්‍රී ලංකාවේ අයිතිවාසිකම් ආරක්ෂා කරන ලද බව සහතික කිරීම සඳහා සියළුම නියමයන් අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

## 5.2 ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)

සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අතර ගෝලීය වෙළඳ වරණ ක්‍රමය **(GSTP)** පිළිබඳ ගිවිසුම **1989** වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය **(GSTP)** යනු, දකුණ - දකුණ අතර වෙළෙඳාම හා ආර්ථික සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් වෙළදාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයෙහි **(UNCTAD)** අනුග්‍රහය යටතේ සාකච්ඡා සම්මුතිවලට එළැඹුණු වරණීය තීරුබදු යෝජනා ක්‍රමයකි.

ගෝලීය වෙළඳ වරණ ක්‍රමයේ තෙවන වටයෙහි සාකච්ඡා සම්මුතිවලට ශ්‍රී ලංකාව සහභාගී විය. විශේෂයෙන්ම, තෙවන වටයේ දී, ප්‍රභවස්ථාන නීති පිළිබඳ සාකච්ඡා සම්මුතිවල දී, ශ්‍රී ලංකාවට පවත්නා වාසිසහගත තත්ත්වයන් වර්ධනයකර ගැනීම සඳහා වන සාකච්ඡා සම්මුතිවලට සහභාගී වී ඇත. **50%** දේශීය වටිනාකම් එකතුව පූර්ණ වශයෙන් ළඟා කරගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි ස්වාභාවික සම්පත් හෝ කම්හල් පාදකයක් නොමැති එම රටවල් මගින් වඩාත් හොඳින් ප්‍රයෝජනයට ගනු ලැබීමට ගෝලීය වෙළඳ වරණ ක්‍රමය **(GSTP)** පිළියෙළ කිරීම සඳහා දේශීය වටිනාකම් එකතුව පහත හෙළිය යුතු බව ශ්‍රී ලංකාවේ මතය වී තිබුණි. අවසාන නියමයන් මගින් ශ්‍රී ලංකාවේ ගැටළු වලට පූර්ණ වශයෙන් විසඳුම් ලබා නොදුණි.

# 6.0 කලාපීය ආර්ථික සහයෝගීතාව

ශ්‍රී ලංකාව, ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම **(APTA)**, දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම **(SAPTA)**, බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන් (BIMSTEC) සහ කලාපීය සහයෝගීතාව සඳහා වූ ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IOR-ARC) වැනි එහි කලාපීය වෙළෙඳ හා ආර්ථික ගිවිසුම් සම්බන්ධයෙන් ප්‍රධාන භූමිකාවක් රඟදක්වන්නෙකු ලෙස තවදුරටත් කටයුතු කරන ලදී.

## 6.1 ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)

ශ්‍රී ලංකාව, ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම යටතේ විශේෂයෙන් චීනය සහ කොරියාව වෙත කරනු ලබන අපනයන අඛණ්ඩව වැඩි කරන ලදී. **2012** වර්ෂයේදී ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම යටතේ චීනය වෙත ශ්‍රී ලංකාවේ අපනයන ඇමෙරිකානු ඩොලර් මිලියන **37**ක් පමණ වූ අතර එම අපනයනයන්ගෙන් බහුතරය වූයේ කොහු කෙඳිය. තේ, මාළු සහ ඇඟලුම් අනෙකුත් නිෂ්පාදනයන්ට ඇතුළත් වූහ.

ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම යටතේ කොරියාව වෙත ශ්‍රී ලංකාවේ අපනයන **2011** වර්ෂයේදී පැවති ඇමෙරිකානු ඩොලර් මිලියන **17** සිට ඇමෙරිකානු ඩොලර් මිලියන **20**ක් දක්වා වැඩි විය. තේ මෙන්ම

ඇඟලුම්, රබර් නිෂ්පාදන සහ පෝසිලේන් භාණ්ඩ වැනි අගය එකතු කළ නිෂ්පාදන අපනයන වැඩිකිරීමත් සමඟ කොරියාව වෙත කරනු ලබන අපනයන, චීනයට වඩා බොහෝ වෙනස් විය.

අදාළ වටය සඳහා මුල් නියමයන් සපුරාලීමට එනම්, 40%ක තීරුබදු සීමා මත 40%ක වරණීය ආන්තික (MOP) සාමාන්‍යයක් ලබාදීමට ඉංදියාවට නොහැකි වූ බව ඉංදියාව දැන්වූ බැවින් ප්‍රමාදවූ 4වන වටයේ සාකච්ඡා සම්මුති ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා සාමාජිකයින් විසින් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. පූර්ණ සහභාගීත්වයෙන් යුතුව 4වන වටය නිමාවට පත්කිරීම සඳහා, ඉංදියාවේ අවසන් අර්පණය මගින් සලසන ලද අවම ප්‍රවේශය සපුරාලීමට චීනයේ සහ කොරියාවේ පිරිනැමුම් සහන ලැයිස්තු ප්‍රතිශෝධනය කිරීම සඳහා එම රටවල් වෙත අවසර ලබාදීමට ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුමේ ස්ථාවර කමිටුවේ 39වන සැසිවාරයේදී සාමාජිකයින් විසින් එකඟවන ලදී. ශ්‍රී ලංකාව සහ ඌන සංවර්ධිත රටවල් විසින් (LDCs) මුල් 40-40 නියමයන් සපුරාලිය යුතු නොවූ බැවින්, ඔවුන්ගේ අර්පණ ලැයිස්තුවල කිසිඳු ප්‍රතිශෝධනයක් සිදු කිරීම අවශ්‍ය නොවේ.

මීට අමතරව, තීරුබදු නොවන ක්‍රියාමාර්ග පිළිබඳ යෝජිත ගිවිසුම් කෙටුම්පත් රාමුවක් මෙන්ම ගිවිසුම වඩාත් හොඳින් ප්‍රයෝජනයට ගැනීමට රටවල් වෙත සහාය දැක්වීම සඳහා ප්‍රභවස්ථාන නීති (Rules of Origin) පුළුල් කිරීම ඇතුළත් අනෙකුත් සහයෝගීතා ක්ෂේත්‍ර පිළිබඳව සාමාජිකයින් විසින් සාකච්ඡා කරන ලදී. ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම සඳහා මොන්ගෝලියාවේ ප්‍රවේශය පිළිබඳව සාකච්ඡා දිගටම පවත්වාගෙන යන ලදී.

### 6.2 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) 2004 ජනවාරි මාසයේදී පාකිස්ථානයේ ඉස්ලාමාබාද්හිදී පැවැත්වූ 12 වන සාර්ක් සමුළුව අතර තුරදී අත්සන් කරන ලද අතර, 2006 ජනවාරි 01 දින සිට බලාත්මකව ක්රියාත්මක කරන ලදී. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ කටයුතු අවසන් කිරීමෙහිලා මූලික වැදගත් කාර්යය, සාමාජික රාජ්යයන්ගේ විශේෂඥ ඥාණය ලබාගනිමින් ස්ථාපිත කරන ලද විශේෂඥ කමිටුව (COE) වෙත පවරාදෙන ලදී.

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ (SAFTA) අරමුණ වන්නේ, 1995 වර්ෂයේ දී දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) ස්ථාපිත කිරීමත් සමඟ ඇරඹි වරණීය වෙළඳ ප්‍රවර්ධනය තුළින් කලාපීය ආර්ථික ඒකීයකරණ වැඩසටහන තවදුරටත් වැඩි දියුණු කිරීමයි.

2012 ජනවාරි සිට ජුනි දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව විසින් දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) යටතේ බංග්ලාදේශය, ඉංදියාව, මාලදිවයින, නේපාලය සහ පාකිස්ථානය වෙත ඇමෙරිකානු ඩොලර් 229,408.00 ක් වටිනා භාණ්ඩ අපනයනය කරනු ලැබ ඇත. එම නිෂ්පාදන වන්නේ, දිසිදි පොල්, පිටිකළ පොල් කිරි, කොප්පරා, පොල් තෙල්, ගම්මිරිස්, සෙරමික් නිෂ්පාදන, සහ කෘත්‍රිම තනි සූත්‍රිකා (synthetic monofilament), ප්‍රතිචක්‍රීය කළහැකි කඩදාසි නිෂ්පාදන, කොහු කෙඳි, දැවමය ගෘහ භාණ්ඩ, ආලේපිත

කැල්සියම් කාබනේට්, සහ ගෙතූ රෙදිපිළි සහ බිම් ගඩොල් (floor tiles) ය. 2007 ජූලි සිට 2012 ජූනි දක්වා කාලය තුළ සාර්ක් සාමාජික රටවල් වෙත ශ්‍රී ලංකාවේ අපනයනවල වටිනාකම ඇමෙරිකානු ඩොලර් 1,289,200.20 ක් වේ.

සෑම සාමාජික රාජ්‍යයක් විසින්ම 20% කින් සංවේදී අයිතම ලැයිස්තු අඩුකිරීම පිළිබඳව ද සාකච්ඡා කරන ලද අතර ශ්‍රී ලංකාව හැර අනෙකුත් සියලුම සාමාජික රාජ්‍යයන් විසින් එහි කටයුතු අවසන් කරනු ලැබ ඇත. ශ්‍රී ලංකාව තවමත් මේ සම්බන්ධයෙන් 20% ක් අඩුකිරීමේ කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටියි.

2012 වසරේ පළමු භාගය තුළදී පහත සඳහන් රැස්වීම් පවත්වන ලදී.

1. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ විශේෂඥ කමිටුවේ (SCOE) හත්වැනි සභාවාරය, 2012 පෙබරවාරි 14  සිට 15 දක්වා.

2. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ අමාත්‍ය සභාවේ හයවැනි සභාවාරය, 2012 පෙබරවාරි 16.

3. සාර්ක් නිදහස් වෙළඳ ගිවිසුම (III වන අදියර) යටතේ සංවේදී අයිතම ලැයිස්තු අඩුකිරීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ පළමු සභාවාරය, 2012 ජූනි 18, නේපාලයේ කත්මණ්ඩු වලදී.

ඉහත සඳහන් සභාවාරයන්හිදී පහත සඳහන් ගැටළු පිළිබඳව සාකච්ඡා කරන ලදී.

- වෙළඳාම් ලිහිල්කරණ වැඩසටහන යටතේ, දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ II වන අදියර කලින් ක්‍රියාත්මක කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග.

- තීරුබදු නොවන ක්‍රියාමාර්ග සහ පැරා තීරුබදු ක්‍රියාමාර්ග අවම කිරීමේ අදහසින් යුතුව ඒවා පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විශේෂ විශේෂඥ කමිටු රැස්වීමක් පැවැත්වීම.

- යෝජිත III වන අදියර යටතේ සංවේදී අයිතම ලැයිස්තුව තවදුරටත් අඩුකිරීම සඳහා වන නියමයන්.

### 6.3 සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS)

සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම් කෙටුම්පත් රාමුව 2010 අප්‍රේල් මාසයේදී අත්සන් කරන ලදී. සාමාජික රටවල් විසින් මෙම ගිවිසුම  යටතේ පවත්නා බැඳීම් උපලේඛනවල කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරනු ලැබ ඇත. එහි ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

- දෝහා සංවර්ධන න්‍යායපත්‍රය (DDA) යටතේ සහාගත කරන ලද මූලික අර්පණ මත පදනම්ව ශ්‍රී ලංකාව විසින් තම මූලික කොන්දේසිගත අර්පණය දැනටමත් ඉදිරිපත් කරනු ලැබ ඇත.

- ශ්‍රී ලංකාව විසින් දැනටමත් සාමාජික රටවල් වෙත ස්වකීය ඉල්ලීම් ලැයිස්තු ඉදිරිපත් කරනු ලැබ ඇති අතර බංග්ලාදේශය, භූතානය, ඉංදියාව සහ නේපාලය යන රටවලින් ඉල්ලීම් ලැයිස්තු මෙතෙක් ලැබී ඇත.

2012 වර්ෂය තුළදී පහත සඳහන් රැස්වීම් පවත්වන ලද අතර ද්විපාර්ශවික සාකච්ඡා සහ බැඳීම් උපලේඛනවල කටයුතු අවසන් කිරීම සඳහා කාල සීමාවන් නියම කිරීම කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කරන ලදී.

1. සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුමේ විශේෂඥ කණ්ඩායමේ අටවැනි සභාවාරය, 2012 ජනවාරි 17 සිට 18 දක්වා නේපාලයේ කත්මණ්ඩු වලදී.

2. සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුමේ විශේෂඥ කණ්ඩායමේ නවවැනි සභාවාරය, 2012 පෙබරවාරි 13 වන දින.

3. සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුමේ විශේෂඥ කණ්ඩායමේ දසවැනි සභාවාරය, 2012 ජුනි 19 සිට 20 දක්වා නේපාලයේ කත්මණ්ඩු වලදී.

## 7.0 වෙළඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධන

### 7.1 වෙළඳ ප්‍රවර්ධනය

ජාත්‍යන්තර වෙළඳ ප්‍රවර්ධනය, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වේ. අපනයනකරුවන් වෙත වෙළඳපළ තොරතුරු ලබාදීම, වෙළඳපළ සම්බාධකයන්ට අදාළ ගැටළු වලට විසඳුම් ලබාදීම, වෙළඳපළ අවශ්‍යතාවන් සඳහා නිෂ්පාදන සකස් කිරීම පිළිබඳව අපනයනකරුවන් දැනුවත් කිරීම, ගැනුම්කරුවන් හඳුන්වාදීම, වෙළඳ සල්පිල් සඳහා සහභාගීත්වය පහසුකරලීම සහ ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි පිහිටි වෙළඳ මණ්ඩල සමඟ ව්‍යාපාරික ජාලයක් ස්ථාපිත කිරීම වෙළඳ ප්‍රවර්ධනය යටතේ සිදුකරනු ලබන කාර්යයන් හා සම්බන්ධ වේ. "මහින්ද චින්තනය" සංකල්පය අනුව යමින් ක්‍රියාත්මක වන පෞද්ගලික රාජ්‍ය හවුල්කාරීත්ව වැඩසටහන යටතේ, විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් ශ්‍රී ලාංකික සමාගම් ජාත්‍යන්තර වෙළඳපළ වෙත හඳුන්වාදීමට මෙම දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. විදේශ රටවල සිටින වෙළඳ නිලධාරීන් මගින් මෙම කටයුතු සම්බන්ධීකරණය කෙරේ.

සමාලෝචනයට බඳුන්වූ කාලපරිච්ඡේදය තුළදී, දෙපාර්තමේන්තුව විසින් මෙම තත්වය තුළ වෙළඳ නිලධාරීන්ගේ සහයෝගය ඇතිව සම්බන්ධීකරණය කරන ලද / සංවිධානය කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් පහත සඳහන් පරිදි වේ;

- ශ්‍රී ලංකා එක්ස්පෝ 2012

2012 මාර්තු මාසයේදී කොළඹදී පවත්වන ලද එක්ස්පෝ 2012 වෙත විදේශීය ගැනුම්කරුවන් / අමුත්තන් ආකර්ශනය කරගැනීම සඳහා අදාළ රටවල එක්ස්පෝ 2012 ප්‍රවර්ධනය කිරීමෙහිලා විදේශ රටවල සේවයෙහි යොදවා ඇති වෙළඳ නිලධාරීන් විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරන ලදී. වෙළඳ නිලධාරීන් විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහයෝගය ඇතිව, එක්ස්පෝ 2012 නැරඹීම සඳහා විදේශීය ආනයනකරුවන්, ආයෝජකයින් යනාදීන් වෙත ආරාධනා කරමින් අදාළ වෙළඳපළ තුළ පුළුල් ප්‍රචාරයක් ලබාදීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කරන ලදී. එක්ස්පෝ 2012 සඳහා අපේක්ෂිත විදේශීය අමුත්තන් සංඛ්‍යාව 1000ක් විය. එහෙත්, අදාළ රටවල සිටින වෙළඳ නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද සාර්ථක ප්‍රවර්ධන ව්‍යාපාරයන් හේතුකොටෙගන මෙම අවස්ථාව සඳහා සහභාගීවූ විදේශීය අමුත්තන් සංඛ්‍යාව, අපේක්ෂිත සංඛ්‍යාව අභිබවා යන ලදී.

- දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය - 2012 සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශන කුටිය

වාණිජ දෙපාර්තමේන්තුව විසින්, අනුරාධපුරයේ ඔයාමඩුවේදී පවත්වන ලද "දැයට කිරුළ 2012" ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සඳහා සහභාගී වන ලදී. දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යයන් සහ සේවාවන් පිළිබඳව මහජනතාව, සිසුන් සහ අපනයනකරුවන් දැනුවත් කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රදර්ශන කුටියේදී තොරතුරු ඇතුළත් පොත් පිංචක් බෙදාදෙන ලදී.

- සංචාරක සීෂෙල්ස් ව්‍යාපාරික දූත පිරිස සමඟ ව්‍යාපාරික හමුව

සීෂෙල්ස් හි අතිගරු ජනාධිපති ජේම්ස් ඇලික්ස් මයිකල් මහතා ව්‍යාපාරික දූත පිරිසක් කැටුව 2012 අගෝස්තු 20 සිට 23 දක්වා ශ්‍රී ලංකාව වෙත නිල සංචාරයක යෙදුණි. මෙම අවස්ථාවේදී, ශ්‍රී ලංකාව සහ සීෂෙල්ස් වෙත අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභී වන වාණිජමය සහ ආර්ථිකමය වාසි සහගත ක්ෂේත්‍ර පිළිබඳව අදහස් හුවමාරු කරගැනීමට පහසුකම් සැලසීමේ අරමුණින් යුතුව, වාණිජ දෙපාර්තමේන්තුව විසින් සංචාරක දූත පිරිස සඳහා උදැසන ආහාරය සහිත හමුවක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනට, රට වෙනුවෙන් කරන ඉදිරිපත් කිරීම් සහ සීෂෙල්ස් හි ව්‍යාපාරයක් ඇරඹීමට

උනන්දුවක් දක්වන ශ්‍රී ලංකාවෙහි පිළිගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාරික ආයතන කිහිපයක පෞද්ගලික ඉදිරිපත් කිරීම් ඇතුළත් වේ.

- සංචාරක ස්වාසිලන්ත ව්‍යාපාරික දූත පිරිස සමඟ ව්‍යාපාරික හමුව

ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා විසින් කරන ලද ආරාධනාවක් මත, ස්වාසිලන්තයේ රාජාභිනායකතුමා නිල දූත පිරිසක් කැටුව දින **03**ක නිල සංචාරයක් සඳහා **2012** අගෝස්තු **13** වන දින ශ්‍රී ලංකාවට පැමිණියේය. මෙම සංචාරයෙහි ප්‍රධාන අරමුණ වූයේ, දෙරට අතර ද්විපාර්ශ්වික සහයෝගීතාව වැඩිදියුණු කිරීමයි.

මෙම සංචාරය අතරතුරදී වාණිජ දෙපාර්තමේන්තුව විසින්, ස්වාසිලන්තයේ සංචාරක දූත පිරිස සහ රාජ්‍ය නිලධාරීන්, පෞද්ගලික අංශයේ සමාගම් සහ ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩලය සමඟ අන්තර් ක්‍රියාකාරී සැසිවාරයක් සංවිධානය කරන ලද අතර, මෙම සැසිවාරය **2012** අගෝස්තු **14** වන දින විදේශ කටයුතු අමාත්‍යාංශයේ රැස්වීම් ශාලාවේදී පවත්වන ලදී.

- ආයෝජන මණ්ඩලයේ ආයෝජක සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අධ්‍යාපන වැඩසටහන

පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳව ආයෝජන මණ්ඩලයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීමේ අදහසින් යුතුව වාණිජ දෙපාර්තමේන්තුව විසින් ආයෝජන මණ්ඩලයේ ආයෝජක සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අධ්‍යාපන වැඩසටහනක් පවත්වන ලදී.

- වර්තමානයේදී ශ්‍රී ලංකාවට අදාළ වන වරණීය වෙළඳ ගිවිසුම්.
- ප්‍රභවස්ථාන රීති නිර්ණායක.
- ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමට අදාළ පිරිවැය ප්‍රකාශයන් සකස්කිරීම සඳහා වන විධි නියමයන්.
- GSP සහතික නිකුත් කිරීම.

- සුළු අපනයන බෝග අපනයනකරුවන් සඳහා වන වැඩමුළුවලදී වාණිජ දෙපාර්තමේන්තුවේ ඉදිරිපත්කිරීම

මෙම වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින්, කුළුබඩු සඳහා ජාත්‍යන්තර වෙළඳපළ තුළ පවත්නා නව වෙළඳපළ අවස්ථා සම්බන්ධයෙන් කලාපීය අපනයනකරුවන් අතර දැනුවත්භාවය ඇතිකිරීමේ අරමුණින් යුතුව, සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වැඩමුළු මාලාවක් සඳහා දායකත්වය ලබාදෙන ලදී.

මෙම වැඩමුළු, මහනුවර, රත්නපුරය සහ කලුතර යන ප්‍රදේශවල පවත්වන ලද අතර, කුළුබඩු වෙළඳපළ තුළ පවත්නා නව වෙළඳපළ ප්‍රවණතා පිළිබඳව අපනයනකරුවන් වෙත අවශ්‍ය තොරතුරු සැපයීම සහ ඉදිරිපත්කිරීම් සිදුකිරීම සම්බන්ධයෙන් වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ක්‍රියාකාරී ලෙස කටයුතු කරන ලදී.

- ටෙස්කෝ පොදු සීමිත සමාගම (TESCO Plc) විසින් සිදුකරන ලද මිලදී ගැනීමේ දූත මෙහෙය

2012 දෙසැම්බර් 4 සිට 7 දක්වා ශ්‍රී ලංකාව වෙත, බ්‍රිතාන්‍ය බහුජාතික සිල්ලර භාණ්ඩ සහ ප්‍රධාන වෙළඳ භාණ්ඩ සිල්ලර වෙළෙඳ සමාගමක් වන ටෙස්කෝ පොදු සීමිත සමාගමේ (British multinational grocery and general merchandise retailer **Tesco plc**) මිලදී ගැනීමේ සංචාරය මෙම දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරන ලදී. එක්සත් රාජධානියේ ලන්ඩනයේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ වාණිජ අංශය මගින් මෙම සංචාරය සංවිධානය කරන ලදී. මෙම සංචාරය අතරතුරදී, ශ්‍රී ලාංකික අපනයන සමාගම් 22ක් ටෙස්කෝ සමාගම සමඟ සාකච්ඡා පවත්වන ලදී. පළමු අදියරේදී, තෝරාගත් ශ්‍රී ලාංකික සමාගම් 5ක තොරතුරු ඇතුළත් ලැයිස්තුවක් සකස් කර ඇති බවත් ටෙස්කෝ සැපයුම් මාර්ගෝපදේශයන්ට අනුව තවදුරටත් එම සමාගම් පිරිසැකසුම් කරමින් සහ ඇගයුමට ලක්කරමින් සිටින බවත් ටෙස්කෝ සමාගම දැනුම් දී ඇත. ටෙස්කෝ සමාගම මගින් 2013 මැයි මාසයේදී පහත සඳහන් සමාගම් පිළිබඳව මූලික කර්මාන්තශාලා විගණනයක් පවත්වනු ලැබ ඇත.

- සී/ස මෙට්‍රික් ප්‍රොඩක්ස් (පෞද්) සමාගම (M/S Metric Products (Pvt) Ltd) – (නිෂ්පාදන: iPad Sleeves, iPhone Sleeves, Microsoft Surface RT Sleeves,7" e-reader Sleeves,10" Tablet Sleeves, Ultra Book Sleeves, iPad cases, Laptop bags)
- සී/ස ලංකා බැලූන්ස් හෝල්ඩින්ස් (පෞද්) සමාගම (M/S Lanka Balloons Holdings (Pvt) Ltd) – (නිෂ්පාදන: ස්වාභාවික රබර් කිරිවලින් නිෂ්පාදිත බැලූන් - Natural Latex Balloons)
- සී/ස ලංකා බ්‍රෂ් එක්ස්පෝට්ස් (පෞද්) සමාගම (M/S Lanka Brush Exports (PVT) Ltd) – (නිෂ්පාදන: පොල් කෙඳි සහ පීවීසී වලින් තැනූ බුරුසු සහ කොසු, සහ තල්, රබර් වලින් නිෂ්පාදිත පෘෂ්ඨයකින් දියර ඉවත් කරන මෙවලම් - Brushes & Brooms Tufted with Coco Fibre, PVC & Palmyrah, Rubber squeegees)

- එක්සත් ජනපද GSP වැඩසටහන පිළිබඳව දැනුවත්භාවය ඇතිකිරීමේ සම්මන්ත්‍රණය

එක්සත් ජනපද - ශ්‍රී ලංකා වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ මූලික ගිවිසුමේ (TIFA) ඒකාබද්ධ කවුන්සිලයේ 10වන රැස්වීම පැවැත්වෙන අවස්ථාවේදී, වාණිජ දෙපාර්තමේන්තුව සහ අපනයන

සංවර්ධන මණ්ඩලය මගින් 2012 මාර්තු 31 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) එක්සත් ජනපද GSP වැඩසටහන පිළිබඳව දැනුවත්භාවය ඇතිකිරීමේ සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. නියෝජ්‍ය සහකාර එක්සත් ජනපද වෙළඳ නියෝජිත, Mara Burr මෙය විසින් ශ්‍රී ලංකා ව්‍යාපාරික ප්‍රජාවගේ යහපත උදෙසා මෙම සම්මන්ත්‍රණය පවත්වන ලදී. ව්‍යාපාරික විධායකවරු 100කට අධික සංඛ්‍යාවක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

- එක්සත් ජනපද දූත පිරිස සහ ශ්‍රී ලංකාවේ කාන්තා වාණිජ මණ්ඩලය අතර හමුව

වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ මූලික ගිවිසුමේ සාකච්ඡාවලින් අනතුරුව, එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායකයින් අතර තාක්ෂණික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා පවත්නා විධි ක්‍රමයන් හඳුනා ගැනීම සඳහා සංචාරක එක්සත් ජනපද දූත පිරිස සහ ශ්‍රී ලංකාවේ කාන්තා වාණිජ මණ්ඩලය අතර හමුවක් පැවැත්වීම සඳහාද දෙපාර්තමේන්තුව මගින් පහසුකම් සලසාදෙන ලදී. මෙම රැස්වීම, කාන්තා වාණිජ මණ්ඩලයේ සාමාජිකයින් 20 දෙනෙකුගේ පමණ සහභාගීත්වයෙන් 2012 මාර්තු 29වන දින වාණිජ දෙපාර්තමේන්තුවේදී පවත්වන ලදී. මෙම සාකච්ඡාවලදී, නියෝජ්‍ය සහකාර එක්සත් ජනපද වෙළඳ නියෝජිත, Mara Burr මෙය විසින් එක්සත් ජනපද පාර්ශ්වය මෙහෙයවන ලදී.

## 7.2 සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම

සංචාරක ව්‍යාපාරය, රටෙහි පැවති ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් අනතුරුව ක්ෂණික අවධානයට ලක්වූ ක්ෂේත්‍ර වලින් එකක් විය. වෙළඳ නිලධාරීන් විසින් සංචාරක ක්ෂේත්‍රය තුළ පවත්නා සුවිශාල ශක්‍යතාවන් හඳුනාගනිමින්, ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයේ සහ ශ්‍රී ලංකන් ගුවන් සේවයේ (Sri Lankan Airlines) සහාය ඇතිව විදේශ රටවල් තුළ විවිධ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරනු ලැබ ඇත. විශේෂ සංසද සහ සම්මේලන සංවිධානය කිරීම, සංචාරක කණ්ඩායම්වල සංචාරයන් සංවිධානය කිරීම, ශ්‍රී ලංකා ප්‍රවර්ධන අංගයන් සංවිධානය කිරීම, ජාත්‍යන්තර සංචාරක සල්පිල් වෙත සහභාගීවීම , ශ්‍රී ලංකාව වෙත මාධ්‍ය දූත පිරිස් සංවිධානය කිරීම, සංචාරක ප්‍රවර්ධන මණ්ඩල ස්ථාපිත කිරීම සහ සත්කාරක රටෙහි විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ප්‍රසිද්ධියක් ලබාදීම, ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳ නිලධාරීන් විසින් අනුගමනය කරන ලද ප්‍රධාන ක්‍රමෝපායන්ට ඇතුළත් වේ.

## 7.3 සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය (FDI)

ශ්‍රී ලංකාව වෙත සෘජු විදේශ ආයෝජන ආකර්ශනය කරගැනීමෙහිලා, විදේශ රටවල සේවයෙහි යොදවා ඇති වෙළඳ නිලධාරීන් විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකිරීම අඛණ්ඩව සිදුකරන ලදී. වෙළඳ නිලධාරීන් විසින් සමාලෝචනයට බඳුන් කරන ලද කාල පරිච්ඡේදය තුළ, ඔවුන්ගේ අදාළ වෙළඳපළ තුළ විභවතාවෙන් යුතු ආයෝජකයින් ලෙස හඳුනාගත් විදේශ සමාගම් සහ පුද්ගලයින් 100කට අධික සංඛ්‍යාවක් හමුවන ලද අතර රටෙහි පවත්නා ආයෝජන අවස්ථාවන් පිළිබඳව ඔවුන් වෙත විස්තර සපයාදෙන ලදී. කර්මාන්තශාලා පිහිටුවීමට ඇති ශක්‍යතාවන් අධ්‍යයනය කිරීම සඳහා මෙම පාර්ශ්වයන්ගෙන් කිහිපදෙනෙකු දැනටමත් ශ්‍රී ලංකාව වෙත පැමිණ ඇත.

## 7.4 වෙළඳ විමර්ශන හා වාණිජ ආරවුල්

වෙළඳ විමර්ශන සම්බන්ධයෙන් සේවා සැපයීමෙහිලා දෙපාර්තමේන්තුව සහ එහි වෙළඳ නිලධාරීන් විසින් සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරන ලදී. වෙළඳ මණ්ඩලය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හරහා විභවතාවෙන් යුතු ගැනුම්කරුවන් පිළිබඳව තොරතුරු ලබාදීම සහ සුදුසු සම්බන්ධතාවන් පිළියෙල කරදීම තුළින් ලැබුනාවූ විමසීම් සම්බන්ධයෙන් සේවා සපයන ලදී. ඒ හා සමාන ලෙස, අපනයනකරුවන් සහ ආනයනකරුවන් අතර සමගි සම්පන්න විසඳුමක් ලබාදීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් වාණිජ ආරවුල්වලට මැදිහත් වේ.

## 7.5 නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම

කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙනුවෙන් වාණිජ අධ්‍යක්ෂ ජෙනරාල් විසින්, ශ්‍රී ලංකාවේ පිහිටි සමාගම්වල / ව්‍යාපාරික ආයතනවල සේවයේ නියුතු විදේශකයින් සඳහා නේවාසික වීසා බලපත්‍ර නිකුත්කිරීම සඳහා ආගමන හා විගමන පාලක වෙත නිර්දේශ ලිපි නිකුත්කරනු ලැබේ. මෙම කර්තව්‍ය ඉටුකිරීමේදී, දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත වීසා බලපත්‍ර අව්‍යාජ වූ බවට සහතිකකිරීම පිළිබඳව අතිරේක අවධානයක් යොමු කරන ලද අතර, ජාතික සංවර්ධනයට මෙන්ම මානව සම්පත් සංවර්ධනය සඳහාද සිය සහාය පළ කරන ලදී.

2012 වසරේ දී, දෙපාර්තමේන්තුව විසින් විවිධ ජාතීන් සඳහා නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ 211ක් නිකුත් කරන ලදී. මෙම ජාතීන් අතර ඉන්දියානු ජාතිකයින් 83ක්ද, බ්‍රිතාන්‍ය ජාතිකයින් 39ක්ද, පාකිස්ථාන ජාතිකයින් 21ක්ද, ජපන් ජාතිකයින් 18ක්, හා ඕස්ට්‍රියානු, ඕස්ට්‍රේලියානු, බෙල්ජියම්, ප්‍රංශ, ජර්මන්, කොරියානු, රුසියානු හා දකුණු අප්‍රිකානු ජාතිකයින්ද වූහ.

## 7.6 1949 අංක 06 දරන උකස් පනත යටතේ ණයදෙන ආයතන අනුමත කිරීම

1949 අංක 06 දරන උකස් පනත යටතේ, ඕනෑම සමාගමක්, වෙළඳ සමාගමක්, ආයතනයක් හෝ පුද්ගලයකු අනුමත කරන ලද ණය දෙන ආයතනයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට වාණිජ අධ්‍යක්ෂ ජනරාල් වෙත බලය පවරා ඇත. අධ්‍යක්ෂ ජනරාල්වරයා එසේ සිය අනුමැතිය දෙනු ලබන්නේ, 1949 අංක 06 දරන උකස් පනතේ

**114 (1)** වන වගන්තිය යටතේ ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයකුගෙන් හා තවත් පුද්ගලයින් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක නිර්දේශ මත පදනම්ව වේ.

## 8.0 ප්‍රභවස්ථාන සහතික නිකුත්කිරීම (COOs)

පහත සඳහන් වරණීය ගිවිසුම් සහ කලාපීය / ද්විපාර්ශ්වික සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය කරනු ලබන ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික නිකුත්කරනු ලබයි.

- වරණීය පොදු ක්‍රමය (GSP)
- ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)
- සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)
- දකුණු-ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- ආසියානු-පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)

ඉහත සඳහන් වරණීය ගිවිසුම්, කලාපීය ගිවිසුම් සහ ද්විපාර්ශ්වික ගිවිසුම් යටතේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් දිනකට ප්‍රභවස්ථාන සහතික **600**ක් පමණ සහතික කරනු ලබයි.

පූර්ව දැනුම්දීමකින් තොරව රාජකාරී වේලාව තුළ ඕනෑම අවස්ථාවක හමුවිය හැකි පූර්ණකාලීනව ප්‍රභවස්ථාන සහතික අංශය වෙත අනුයුක්තව කටයුතුකරන, ඉතා ඉහළ මට්ටමින් අභිප්‍රේරණය කරන ලද නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් උපදෙස් ලබා දීම සඳහාත්, වැඩිදුර තොරතුරු පැහැදිලිකර දීම සඳහාත් සූදානම්ව සිටියි. සාමාන්‍යයෙන්, පත්කර ඇති නිලධාරීන් විසින් අපනයනකරුවන් **25** දෙනෙකුට පමණ දිනපතා උපදෙස් ලබා දෙනු ලැබේ.

ඒ ඒ ගිවිසුම් යටතේ **2011** හා **2012** යන වර්ෂවල නිකුත්කරන ලද ප්‍රභවස්ථාන සහතික සංඛ්‍යාව දැක්වෙන සංසන්දනාත්මක වගුවක් පරිශිෂ්ට **- 1**හි දක්වා ඇත.

**පරිශිෂ්ටය - 1**

**2011 හා 2012 කාල පරිච්ඡේදය සඳහා වරණීය වෙළඳ ගිවිසුම් යටතේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික**

| අංකය | රට | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|
| | | ප්‍රභවස්ථාන සහතික සංඛ්‍යාව | % | ප්‍රභවස්ථාන සහතික සංඛ්‍යාව | % |
| | වරණීය පොදු ක්‍රමය **(GSP)** යටතේ | | | | |
| 1 | ඔස්ට්‍රියාව | 330 | 0.25 | 342 | 0.30 |
| 2 | බෙල්ජියම | 5,832 | 4.46 | 5376 | 4.72 |
| 3 | බල්ගේරියාව | 80 | 0.06 | 62 | 0.05 |
| 4 | සයිප්‍රසය | 873 | 0.67 | 616 | 0.54 |
| 5 | චෙච් සමූහාණ්ඩුව | 374 | 0.29 | 784 | 0.69 |
| 6 | ඩෙන්මාර්කය | 916 | 0.7 | 784 | 0.69 |
| 7 | එස්ටෝනියාව | 90 | 0.07 | 73 | 0.06 |
| 8 | පින්ලන්තය | 350 | 0.27 | 297 | 0.26 |
| 9 | ප්‍රංශය | 6,914 | 5.29 | 5226 | 4.59 |
| 10 | ජර්මනිය | 15,204 | 11.62 | 9456 | 8.30 |
| 11 | ග්‍රීසිය | 212 | 0.16 | 143 | 0.13 |
| 12 | හංගේරියාව | 134 | 0.1 | 136 | 0.12 |
| 13 | අයර්ලන්තය | 481 | 0.37 | 522 | 0.46 |
| 14 | ඉතාලිය | 7,512 | 5.74 | 4960 | 4.36 |
| 15 | ලැට්වියාව | 190 | 0.15 | 170 | 0.15 |
| 16 | ලිතුවේනියාව | 84 | 0.06 | 130 | 0.11 |
| 17 | ලක්ස(ර්)ම්බර්ගය | 0 | 0 | 3 | 0.00 |
| 18 | මෝල්ටාව | 19 | 0.01 | 17 | 0.01 |
| 19 | නෙදර්ලන්තය | 5,678 | 4.34 | 5089 | 4.47 |
| 20 | පෝලන්තය | 867 | 0.66 | 825 | 0.72 |
| 21 | පෘතුගාලය | 156 | 0.12 | 159 | 0.14 |
| 22 | රුමේනියාව | 49 | 0.04 | 59 | 0.05 |
| 23 | ස්ලෝවැකියාව | 2,004 | 1.53 | 1193 | 1.05 |
| 24 | ස්ලෝවේනියාව | 69 | 0.05 | 59 | 0.05 |
| 25 | ස්පාඤ්ඤය | 1,663 | 1.27 | 1301 | 1.14 |
| 26 | ස්වීඩනය | 2,940 | 2.25 | 1366 | 1.20 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 27 | එක්සත් රාජධානිය | 43,652 | 33.37 | 38825 | 34.09 |
| 28 | නැගෙනහිර යුරෝපා රටවල් | 1,317 | 1.01 | 0 | 0.00 |
| 29 | ඕස්ට්‍රේලියාව | 583 | 0.45 | 696 | 0.61 |
| 30 | කැනඩාව | 660 | 0.5 | 1162 | 1.02 |
| 31 | ජපානය | 3,254 | 2.49 | 3325 | 2.92 |
| 32 | නවසීලන්තය | 155 | 0.12 | 160 | 0.14 |
| 33 | නෝර්වේ | 419 | 0.32 | 612 | 0.54 |
| 34 | රුසියානු සමූහාණ්ඩුව | 3,610 | 2.76 | 3519 | 3.09 |
| 35 | ස්විට්සර්ලන්තය | 990 | 0.76 | 1075 | 0.94 |
| 36 | තුර්කිය | 1,996 | 1.53 | 914 | 0.80 |
| 37 | අමෙරිකා එක්සත් ජනපදය | 2,196 | 1.68 | 2319 | 2.04 |
| 38 | බෙලාරුස් | 96 | 0.07 | 103 | 0.09 |
| 39 | පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රටවල් | 871 | 0.67 | 1009 | 0.89 |
| | ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම **(APTA)** යටතේ | | | | |
| 40 | බංග්ලාදේශය | 6 | 0 | 1 | 0.00 |
| 41 | චීනය | 1,354 | 1.04 | 1770 | 1.55 |
| 42 | ඉන්දියාව | 182 | 0.14 | 72 | 0.06 |
| 43 | කොරියාව | 364 | 0.28 | 938 | 0.82 |
| | සැෆ්ටා **(SAFTA)** ගිවිසුම යටතේ | | | | |
| 44 | සැෆ්ටා - ඉන්දියාව | 9 | 0.01 | 7 | 0.01 |
| 45 | සැෆ්ටා - බංග්ලාදේශය | 8 | 0.01 | 4 | 0.00 |
| | සැෆ්ටා - මාලදිවයින | 0 | | 5 | 0.00 |
| | සැෆ්ටා - පකිස්ථානය | 0 | | 8 | 0.01 |
| | සැෆ්ටා - නේපාලය | 0 | | 2 | 0.00 |
| | සප්තා **(SAPTA)** ගිවිසුම යටතේ | | | | |
| 48 | බංග්ලාදේශය | 0 | 0 | 1 | 0.00 |
| 49 | භූතානය | 0 | 0 | 0 | 0.00 |
| 50 | ඉන්දියාව | 205 | 0.16 | 240 | 0.21 |
| 51 | මාලදිවයින | 0 | 0 | 2 | 0.00 |
| 52 | නේපාලය | 1 | 0 | 0 | 0.00 |
| 53 | පකිස්ථානය | 33 | 0.03 | 10 | 0.01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගෝලීය වෙළඳ වරණ ක්‍රමය **(GSTP)** යටතේ | | | | |
| 54 | පේරු | 73 | 0.06 | 99 | 0.09 |
| 55 | මෙක්සිකෝව | 26 | 0.02 | 35 | 0.03 |
| 56 | චිලී | 0 | 0 | 1 | 0.00 |
| 57 | බ්‍රසීලය | 0 | 0 | 1 | 0.00 |
| 58 | ඉරානය | 0 | 0 | 0 | 0.00 |
| | ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ | | | | |
| 59 | ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | 10,373 | 7.93 | 9742 | 8.55 |
| 60 | පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) | 5,219 | 3.99 | 8057 | 7.07 |
| 61 | GSP- ඉන්දියාව (කලාපීය සමුච්චිතය) | 0 | | 24 | 0.02 |
| | සමස්ත ප්‍රභවස්ථාන සහතික සංඛ්‍යාව | 130,814 | 100 | 113886 | 100.00 |

කාර්ය මණ්ඩල සංචලන - 2012

| නිලධාරියාගේ නම | සංචලනය | දිනය |
|---|---|---|
| පී.ඩී. ප්‍රනාන්දු මහතා,<br>වාණිජ අධ්‍යක්ෂ ජෙනරාල් | වාණිජ අධ්‍යක්ෂ ජෙනරාල් වශයෙන් රාජකාරි භාරගන්නා ලදී. | 2012.01.02 |
| පී.එම්.බී. සෝමසිරි මහතා,<br>වාණිජ අධ්‍යක්ෂ | වාණිජ අධ්‍යක්ෂ වශයෙන් උසස් කරන ලදී. | 2012.01.02 |
| එල්.පී. පීරිස් මහත්මිය,<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ වශයෙන් උසස් කරන ලදී. | 2012.01.01 |
| එම්. සෝමසේන මහතා,<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ වශයෙන් උසස් කරන ලදී. | 2012.01.01 |
| පී.ඒ.එස්. පොන්නම්පෙරුම මහතා,<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ වශයෙන් උසස් කරන ලදී. | 2012.01.01 |
| එස්.පී.කේ. විජේසේකර මහතා,<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ වශයෙන් උසස් කරන ලදී. | 2012.01.01 |
| ඩී.ඩී. ප්‍රේමරත්න මහතා,<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ වශයෙන් උසස් කරන ලදී. | 2012.01.01 |
| සී.ඩී. යටගොඩ මහතා,<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ වශයෙන් උසස් කරන ලදී. | 2012.01.01 |
| ස්ථාන මාරුවීම් | | |
| පී.ඩී. ප්‍රනාන්දු මහතා,<br>වාණිජ අධ්‍යක්ෂ | ඕස්ට්‍රේලියාවේ සිඩ්නිහි ශ්‍රී ලංකා කොන්සියුලර් ජෙනරාල් වශයෙන් වූ සේවා කාලය අවසන්වීමෙන් අනතුරුව නැවතත් දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන ලදී. | 2012.01.02 |
| එස්.බී. ගොඩවිට මහතා,<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ඇමෙරිකා එක්සත් ජනපදයේ ලොස් ඇන්ජලීස්හි පිහිටි ශ්‍රී ලංකා කොන්සියුලර් කාර්යාලයේ කොන්සියුලර් (වාණිජ) වශයෙන් වූ සේවා කාලය අවසන්වීමෙන් අනතුරුව නැවතත් දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන ලදී. | 2012.01.18 |
| ජේ.එන්. කුමාර මහතා,<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ලන්ඩනයේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ පළමු ලේකම්වරයා (වාණිජ) වශයෙන් වූ සේවා කාලය අවසන්වීමෙන් අනතුරුව නැවතත් දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන ලදී. | 2012.09.03 |
| බී.ජී.පී.ජයකොඩි මහතා,<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | පළමු ලේකම්වරයා (වාණිජ) වශයෙන් ඊජිප්තුවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත පත් කරන ලදී. | 2012.11.28 |

**ශීර්ෂ අංකය/த லபப இல /Head No:295**

**අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව:- වාණිජ දෙපාර්තමේන්තුව**
**அ மசச/துணககளம -வரததகதத ணககளம**
**Ministry/Department:-Department of Commerce**

**වැඩසටහන් අංකය/ந கமசச ததடட இல/ Programme No:01**

**ව්‍යාපෘතිය 1/க ரதத டட இல/Project 1**

**පුනරාවර්තන වියදම්/மண வ ரம சலவ/Recurrent Expenditure**

| විස්තරය<br>வ வரணம<br>Description | 2011<br>සත්‍ය<br>වියදම<br>Actual<br>Rs. | 2012<br>අනුමත<br>ඇස්තමේන්තුව<br>Actual<br>Rs. | 2012<br>සංශෝධිත<br>ඇස්තමේන්තුව<br>Revised<br>Estimate<br>Rs. | 2012<br>සත්‍ය වියදම<br>Actual<br>Rs. | ඉතිරිය<br>Savings<br>Rs. |
|---|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි<br>ஆளககரய வதன தகன<br>Personal Emoluments | 24922000 | 31275000 | 31275000 | 26823235 | 4451765 |
| වෙනත්<br>ஏ னயவகன<br>Other | 50499000 | 58030000 | 58030000 | 54490223 | 3539777 |
| මුළු වියදම් පුනරාවර්තන<br>එකතුව/ ம ததம/Total | **50499000** | **89305000** | **89305000** | **81313458** | **7991542** |

මූලධන වියදම්
**மூலதனச், செலவு**
Capital Expenditure

| වැය විෂය අංකය විස්තර / | ('000)<br>සත්‍ය වියදම<br>**உண்மை**<br>Actual<br>(2011) | ('000)<br>අනුමත<br>ඇස්තමේන්තු<br>**மதிப்பீடு**<br>Estimate (2012) | ('000) සංශෝධිත<br>ඇස්තමේන්තු<br>**மீளாய்வு**<br>**செய்யப்பட்ட மதிப்பீடு**<br>Revised Estimate<br>(2012) | ('000)<br>සත්‍ය වියදම<br>**உண்மை**<br>Actual<br>(2012) | ඉතිරිය<br>**சேமிப்பு**<br>Savings |
|---|---|---|---|---|---|
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම<br>**மூலதன சொத்துக்களின் முன்னேற்றம்**<br>**Rehabilaisation and Improvement of Capitasl Assets** | 328 | 580 | 580 | **433** | **147** |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ (2002)<br>**பொறித்தொகுதியும் இயந்திர வகையும் உபகரணமும்**<br>Plant Machinery & Equipment | 110 | 400 | 400 | 299 | 101 |
| වාහන (2003)<br>**வாகனங்கள்**<br>Vehicles | 218 | 180 | 180 | 134 | 46 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම<br>**மூலதன இருப்பு சொத்துக்கள் கைப்பற்றல்**<br>Acquisition of Capital Assets | 610 | 900 | 900 | **828** | **72** |
| වාහන<br>**வாகனங்கள்**<br>Vehicles | – | – | – | – | – |
| ලී බඩු හා කාර්යාලයීය උපකරණ(2102)<br>**தளபாட காரரியாலய உபகரணம்**<br>Furniture & Office Equipment | 373 | 400 | 850 | 780 | 70 |
| යන්ත්‍රෝපකරණ (2103)<br>**இயந்திர வகை**<br>Machinery | 237 | 500 | 50 | 48 | 2 |
| හැකියා වර්ධනය<br>**கொள்திறன் கட்டுமானம்**<br>**Capacity Building** | 495 | 500 | 500 | **322** | **178** |
| පුහුණු කිරීම හා හැකියා වර්ධනය (2401)<br>**பயிற்சியும்கொள்திறன் கட்டுமானமும்**<br>Training & Capacity Building | 495 | 500 | 500 | 322 | 178 |
| වෙනත්<br>**ஏனைய மூலதனம்**<br>**Other Capital** | **3523** | **7000** | 7000 | **5420** | **1580** |
| වෙළඳ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් (2502)<br>**வார்த்தக விருத்தி செயற்பாடுகள்**<br>Trade Promotion Activities | 3523 | 7000 | 7000 | 5420 | 1580 |
| එකතුව/**மொத்தம்** /Total | 4956 | **8980** | **8172** | **7003** | **1169** |